# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා විසින්
2023 ජනවාරි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 දෙසැම්බර් මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[165 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 25.00 තැපැල් ගාස්තුව : රු. 50.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු " සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ අධ්‍යයන කටයුතු සිදු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලැස්වීම;

(ආ) මනා බැංකුකරණ ව්‍යුහයක් පවත්වාගෙන යෑමට හා සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ කර එම යෝජනා නියාමන බලධාරීන් වෙත යොමු කිරීම;

(ඇ) බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ දිරිගැන්වීම සඳහා ත්‍යාග හා ශිෂ්‍යත්ව හෝ අන් කවර හෝ ප්‍රදානයන් පිරිනැමීම ;

(ඈ) බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සංවිධානය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය, පෞද්ගලික හා ජාත්‍යන්තර නියෝජිතායතන හා ආයතනයන් සමග වූ ගිවිසුම් මත අධ්‍යයනයන් හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(ඉ) බැංකුකරණ හා මුල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ ඉගැන්වීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීම;

(ඊ) බැංකුකරණ හා මූල්‍ය සේවාවන්ට අදාළ විෂයයන්හි දැනුම හා දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශිෂ්‍යයන් හා වෙනත් තැනැත්තන් පර්යේෂණ ක්‍රමවේදය සම්බන්ධයෙන් පුහුණු කිරීම;

(උ) සිය සාමාජිකයින්ගේ කුසලතා හා වෘත්තීයවේදීත්වය ඉහළ නංවනු පිණිස බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය පිළිබඳව ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම;

(ඌ) සිය සාමාජිකයන්ගේ වෘත්තීයවේදී හා අධ්‍යයන අභිවෘද්ධියට අදාළ ගැටලු පිළිබඳව සාමාජිකයන්ට හා අන් කවර හෝ තැනැත්තන්ට හඬක් ඇති කිරීමට, අදහස් පළ කිරීමට, සන්නිවේදනය කිරීමට, සාකච්ඡා කිරීමට හා ඒවා නිරාකරණය කර ගැනීමට මණ්ඩපයක් ඇති කිරීම සහ බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය ආශ්‍රිත සඵලදායී ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහාය වීම;

(ඵ) බැංකුකරණ හා මූල්‍ය සේවා සම්බන්ධ ගැටලු පිළිබඳව වාර්තා පිළියෙල කරනු පිණිස හා ඉදිරිපත් කරනු පිණිස සිය සාමාජිකයන් අතර සාමූහිකත්වය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම;

(ඒ) පොදු හෝ සමාන අභිලාෂයන් සහිත වෙනත් ජාතික හා ජාත්‍යන්තර සභා, මණ්ඩප හා ආයතන සමග අවබෝධය, සහයෝගය හා සුහදත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඔ) බැංකුකරණ හා මූල්‍ය සේවාවන්ට සම්බන්ධ සහ සමාන අරමුණු සහිත කවර හෝ ජාතික, කලාපීය හෝ ජාත්‍යන්තර සංගම් සමග අනුබද්ධ වීම;

(ඕ) ස්වීයව හෝ වෙනත් දේශීය හෝ විදේශීය සංගම් සමග ඒකාබද්ධව ජාත්‍යන්තර කරළිය තුළ හෝ විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ බැංකුකරණ හා මූල්‍ය සේවා පිළිබඳ සමීක්ෂණ හා අධ්‍යයන සිදු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා මෙහෙයවීම;

(ක) වෘත්තියෙහි පොදු අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම;

(ග) අධ්‍යාපනික වැඩසටහන් මෙහෙයවීම මගින් මහජනතාව අතර, යහපත් බැංකුකරණ පිළිවෙත් හා පුරුදු ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම.

(2) කිසිදු ආමාත්‍යාංශයක/ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක ඒ හා සමගාමීව සිදු කරනු ලබන කිසියම් කාර්යයක් හා සංස්ථාවෙහි කාර්යයක් අතර කිසිදු ගැටීමක් ඇති නොවන අයුරින් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කෙරෙනු ඇත.

**4.** (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් කරුණුවලට අදාළ බලතල ද ඇතුළත්ව සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සියලු ක්‍රියා ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය, සංස්ථාව සතු වේ:—

සංස්ථාවේ සාමාන්‍ය බලතල

(අ) සංස්ථාවේ අරමුණු සඳහා අවශ්‍ය පරිදි ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට, හා අලුත්වැඩියා කිරීමට සහ සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීමේ අරමුණු පෙරදැරිව යෝග්‍ය පරිදි ඒ හා සම්බන්ධ කටයුතු හෝ විකුණුම් සඳහා;

(ආ) කිසියම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු බැහැරදීම් හෝ වෙනයම් අයුරකින් සංස්ථාව වෙත පැවරුණු චංචල හා නිශ්චල දේපළ දැරීමේ බලතල සහ මෙහි 3 වන වගන්තිය යටතේ සංස්ථාවේ රීතිවලට යටත් ව මෙම පනතේ පරමාර්ථය සඳහා සංස්ථාව විසින් එබඳු සියලු දේපළ විකිණීමට, උකසට තැබීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනයම් අයුරකින් කටයුතු කිරීමට බලතල සහිතව රඳවා ගනු ලබයි;

(ඇ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය පරිදි හෝ සියලුම ගිවිසුම් හා එකඟතාවන්ට ඍජුවම හෝ සංස්ථාව වෙනුවෙන් බලය පැවරුණු කිසියම් නිලධාරියකු/ නියෝජිතයකු හරහා ඇතුළත්වීම හා ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම;

(ඈ) සංස්ථාව වෙත කරන ලද සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග සම්බන්ධයෙන් මූල්‍ය ක්ෂේත්‍රය විෂයයට පත් කරනු ලබන අමාත්‍යවරයාට අයත් බාහිර සම්පත් පිළිබඳ දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය, සභාව විසින් ලබාගනු ලැබීමට යටත්ව, සුරැකුම් සහිතව/රහිතව අරමුදල් ණයට ගැනීමට/අරමුදල් ඉපයීමට සහ මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ලෙස ප්‍රදාන/ ත්‍යාග/පරිත්‍යාග ලැබීමට;

(ඉ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි උපකරණ පිළියෙල කිරීම, සැකසීම, භාරගැනීම, වට්ටම් ලබාදීම, පිටසන් කිරීම, ප්‍රතිදාන කිරීම, විකිණීම, මිලට ගැනීම හා නිකුත් කිරීම සහ ඕනෑම බැංකුවක ගිණුම් විවෘත කිරීමට, මෙහෙයවීමට, පවත්වාගෙන යාමට හා පියවීමට;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීමට වහාම අවශ්‍ය නොවන අරමුදල් වෙතොත් එකී අරමුදල් සභාව විසින් තීරණය කරනු ලබන අන්දමට ආයෝජනය කිරීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීමේ අරමුණින් කිසියම් නීත්‍යනුකූල අරමුදල් හෝ කිසියම් සත්‍ය හෝ පෞද්ගලික දේපළක් පවරා ගැනීම, භාර ගැනීම, ක්‍රියාත්මක කිරීම ඉටුකිරීම සහ පරිපාලනය කිරීම;

(ඈ) සංස්ථාවේ නිලධාරීන් සහ සේවකයන් සේවාවට පත් කිරීම, සේවයේ යෙදවීම, සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ විනය පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම හා සංස්ථාව තීරණය කරනු ලබන පරිදි ඔවුන්ට වැටුප්, දීමනා හා පාරිතෝෂික ගෙවීම;

(එ) සංස්ථාවේ පරමාර්ථයන්ට ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශන, වැඩමුළු, සමුළු සංවිධානය කිරීම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථයන්ට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන හා සම්බන්ධීකරණය කිරීම;

(ඔ) සංස්ථාවේ පරමාර්ථයන්ට සරිලන පරිදි සංස්ථාවේ නිලධාරීන්ට හෝ සේවකයන්හට මෙරට හා විදේශීය පුහුණුවක් ලබාදීම;

(ඕ) මෙම පනත යටතේ සංස්ථාවේ පරමාර්ථ හා කාර්යභාරයන් ඉටුකිරීමට අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි අමතර හා උපසේවී වෙනත් සියලු ක්‍රියා සඳහා.

(2) කුමන ආකාරයෙන් උපත්පාදනය වුව ද සංස්ථාවේ මුදල් හා දේපළ, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පූර්ණ වශයෙන් යොදවනු ලැබිය යුතු අතර, එහි කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත ඍජුව ම ප්‍රේෂණය කිරීම හෝ ගෙවීම හෝ ලාභාංශ, වරප්‍රසාද දීමනා හෝ ලාභ ලෙස වක්‍රාකාරව ගෙවීම සිදු නොවනු ඇත.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, මෙම පනතේ බලපවත්නා විධිවිධාන සහ සංස්ථාවේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත් ව (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ සභාවක් වෙත පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධූර දැරූවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති

**6.** (1) පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම;

(අ) එක් වාරයක් තුළ තෙවසරකට වඩා නොවැඩි කාලසීමාවකට එක් ධූර දරන්නෙකුහට සිය ධූරය හෙබවිය හැකි පදනම සහ නැවත තෝරා පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන පදනම මත,

සභාවේ ධූර දරන්නන් තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධූරයෙන් ඉවත් කිරීම හෝ ධූර අත් හැරීම සහ සභාවේ ධූර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, නියම හා කොන්දේසි;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ හා සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන යම් රීති, මාස 3 ක් ඇතුළත ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කළ යුතු අතර, එහි සඳහන් දින සිට බලපැවැත්වෙනු ඇත.

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ දක්වා ඇති පරිදි ම ප්‍රකාශයට පත් කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විටම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

සංගමය සතු දේපළ සංස්ථාව සතු වීම

**7.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට-

(අ) සංගමයට අයත්ව තිබූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද;

(ආ) සංගමයේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ අභිලාෂයන් සහ සංගමයේ සියලු බැරකම් ද;

(ඇ) සංගමයේ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද,

සම්පූර්ණයෙන් සංස්ථාව වෙත සතු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි-

(අ) සංගමයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සංගමයේ සියලු බැරකම්, සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සිට සංගමයේ සියලු නිලධරයන් සහ සේවකයන් සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) පැවති සංගමයේ කාර්යයන් සඳහා ඇතුළත් වූ සහ මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දින වන විට පවතින සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) මෙම පනත ක්‍රියත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දින වන විට විනිශ්චයට භාජනයව පැවතියා වූ සංගමය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇත්තා වූ ද සියලු නඩු හා නඩු කටයුතු, සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හා නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබ අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

**සාමාජිකයන්ගේ නාම ලේඛනය**

**8.** සාමාජිකයන්ගේ නම, ලිපිනය හා අනෙකුත් අත්‍යවශ්‍ය විස්තර ඇතුළත් සාමාජිකයන්ගේ නාමලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යනු ඇත.

**සංස්ථාවේ අරමුදල**

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු යනාදියෙන් ලද සියලු මුදල් සහ දේ මගින් සංස්ථාවේ අරමුදල සමන්විත වනු ඇත.

(2) සංස්ථාවේ නමට ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුණු මුදුන්පත්වන සුදුසු ආකාරයට ආයෝජනය කර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ බලතල, කර්තව්‍යයන් හා කාර්යභාරය ඉටු කිරීමේ දී හා ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**ගිණුම්, විගණනය සහ වාර්ෂික වාර්තාව**

**10.** (1) ලිත් වර්ෂය, සංස්ථාවේ මූල්‍ය වර්ෂය ලෙස සලකනු ලැබේ.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක් යන්නෙන් අදහස් වේ.

(5) සෑම මූල්‍ය වර්ෂයක් සඳහා ම සංස්ථාවේ ක්‍රියාකාරම්වල වාර්තාවක් සභාව විසින් පිළියෙල කරනු ඇති අතර ගිණුම්වල විගණිත ප්‍රකාශයක් සමග එම වාර්තා බැංකුකරණ විෂය අයත් අමාත්‍යවරයාගේ ලේකම් වෙත, එකී වාර්තා අදාළ වන වර්ෂයෙන් පසුව එළැඹෙන වර්ෂයේ සය (6) මාසයක් ඉක්ම යාමට ප්‍රථම භාරදිය යුතු ය.

(6) මූල්‍ය වර්ෂය තුළ සංස්ථාව ලද දේශීය හෝ විදේශීය මුදල්වලට අදළ වෙනම ගිණුම් විස්තර අංක 5 දරන අනුවගන්තිය යටතේ දක්වා ඇති වාර්ථාවලට අමුණනු ලැබෙයි.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු මුදල්

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංගමයෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, කළමනාකරණ සභාව විසින් තීරණය කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**13.** සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ ධූර දරන්නන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුවද සාධනපත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම

**14.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**15.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් තැනැත්තකුගේ දේශපාලනික හෝ ආයතනික අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.